සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

52 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

## Third Term Test - Grade 13 - 2016

විභාග අංකය ................................. **නැටුම් I** කාලය පැය දෙකයි

**වැදගත්**

අංක 01 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.

01. ''ඔඩි හෙලේ හෙල වටකර මුළුල්ලා - ගල් නළලත බැන්දා වැනි තොටිල්ලා'' මෙය,
   1. හත්අඩියේ කවියකි. 2. පතල් කවියකි. 3. බඹර කැපීමේ කවියකි.
   4. සිරසපාද කවියකි. 5. ටීකා සී පදයකි. (.........)

02. යක්දෙස්සා සහ කොට්ටෝරුවා යන පාරිභාෂික වචන භාවිතා කරනුයේ,
   1. දෙවොල් මඩුවේය. 2. සන්නි යකුමේය. 3. පහන් මඩුවේය.
   4. කොහොඹාකංකාරියේය. 5. රටයකුමේය. (.........)

03. අර්නෝලිස් ඉඹුල්ගොඩ, සව්රිස් සිල්වා, රද්දැල්ලේ පොඩිමහත්තයා යන ප්‍රවීන නර්තන ශිල්පීන් ප්‍රසිද්ධියට පත්වූයේ පිළිවෙලින්,
   1. පහතරට, සබරගමු හා උඩරට සම්ප්‍රදායටය. 2. උඩරට, සබරගමු හා පහතරට සම්ප්‍රදායටය.
   3. උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායටය. 4. සබරගමු, උඩරට හා පහතරට සම්ප්‍රදායටය.
   5. පහතරට, උඩරට හා සබරගමු සම්ප්‍රදායටය. (.........)

04. දේශීය තාල පද්ධතිය පිළිබඳ කරුණු ඇතුළත් තාල ඥාණය, සිංහල තිත් තාල ක්‍රමය, උඩරට තාල ශාස්ත්‍රය කෘති රචනා කළේ,
   1. මුදියන්සේ දිසානායක, ජයසේන කෝට්ටගොඩ, සරත් විජේවර්ධන මහතුන් ය.
   2. මුදියන්සේ දිසානායක, චාල්ස් ගොඩකුමුර, ජේ.ඊ. සේදරමන් මහතුන් ය.
   3. ජේ.ඊ. සේදරමන්, පිටිගල ජයසේන, තිස්ස කාරියවසම් මහතුන් ය.
   4. වින්සන්ට් සෝමපාල, ජයසේන කෝට්ටගොඩ, චාල්ස් ගොඩකුමුර මහතුන් ය.
   5. වින්සන්ට් සෝමපාල, සරත් විජේවර්ධන, ජේ.ඊ. සේදරමන් මහතුන් ය. (.........)

05. දේශීය ගැමි නැටුම බිහිවීමට පසුබිම් වී ඇත්තේ,

1. විශ්වාස ඇදහිලි හා චිත්තාවේගයන්ය. 2. විශ්වාස ඇදහිලි හා ආර්ථික රටාවය.

3. විනෝදාස්වාදය, ජීවන වෘත්තීන් හා විශ්වාසය ය. 4. ඒකාකාරී බව, සංස්කෘතිය හා ආර්ථික රටාවය.

5. ආගම, ඇදහිලි හා සංස්කෘතියයි. (.........)

06. අත්‍යා බෙර වැයීම යනු,

1. කණ්ඩායමක් සහභාගීවන නිර්මාණී වාදන අවස්ථාවකි.

2. ශිල්පීන් දෙදෙනෙකු සහභාගී වන වාද බෙර අවස්ථාකි.

3. ශිල්පීන් තිදෙනෙකු සහභාගී වන මගුල් බෙර අවස්ථාවකි.

4. කණ්ඩායමක් සහභාගීවන ශාස්ත්‍රීය වාදන අවස්ථාවකි.

5. ශිල්පීන් දෙදෙනෙකු සහභාගීවන අලංකාර පද වාදන අවස්ථාවකි. (.........)

07. තෙල්මේ, නානුමුරය සහ දේවකෝල්පාඩුව ඇතුළත් ශාන්තිකර්ම පිළිවෙලින්,

1. දෙවොල් මඩුව, පහන් මඩුව හා රටයකුම 2. දෙවොල් මඩුව, සන්නියකුම හා පහන් මඩුව

3. රිද්දි යාගය, සූනියම් යාගය හා බලි යාගය 4. දෙවොල් මඩුව, රටයකුම හා පහන් මඩුව

5. දෙවොල් මඩුව, රිද්දි යාගය හා කොහොඹා කංකාරිය (.........)

08. ''එක්දින මොහොතින් නැකත ද රැගෙනේ.....'' මෙහි

1. ලඝු අක්ෂර 10 - ගුරු අක්ෂර 03 2. ලඝු අක්ෂර 15 - ගුරු අක්ෂර 16

3. ලඝු අක්ෂර 13 - ගුරු අක්ෂර 02 4. ලඝු අක්ෂර 12 - ගුරු අක්ෂර 03

5. ලඝු අක්ෂර 11 - ගුරු අක්ෂර 02 (.........)

09. සෝෂක බෙරය හා පොකුරු බෙරය යොදා ගනු ලබන අවස්ථා දෙකකි.

1. අත්‍ය බෙර වාදනය, බලි යාගය

2. කුමාර සමයම, තේවා වාදනය

3. පෙරහැර අවස්ථාව, රටයකුම

4. සන්නි යකුම, අණබෙර වාදනය

5. සන්නි යකුම, හේවිසි වාදනය (.........)

10. කොහොඹාකංකාරියේ එන චාරිත්‍ර විධි දෙකකි.

1. කප් සිටුවීම, මිල්ල කැපීම 2. අයිලේ යැදීම, මුරුතැන් පිදීම

3. මල පේ කිරීම, තොටමෙට යාම 4. තොට පේ කිරීම, මිල්ල කැපීම

5. හඟලෙ යැදීම, හලං වැඩමවීම (.........)

11. අත්මිණිය සහ පන්දම රංග භාණ්ඩ ලෙස භාවිතා වනුයේ,

1. ගැමි නැටුම්වල දී ය. 2. සන්නි නැටුම්වල දී ය. 3. බලි යාගයේ දී ය.
4. අස්නෙ නැටුමේ දී ය. 5. වඩිග පටුනේ දී ය. (.........)

12. ''අඳිමින් සුදු පට සළු ගෙල සඳුනෙත් තුනු තවරා ...'' මෙම පද්‍ය ඇතුළත් වන්නේ,

1. කෝට්ටේ යුගයේ සැවුල් සංදේශයේ ය. 2. ගම්පල වුගයේ සේර සංදේශයේ ය.
3. ගම්පල යුගයේ මයුර සංදේශයේ ය. 4. කෝට්ටේ යුගයේ කෝකිල සංදේශයේ ය.
5. කෝටටේ යුගයේ ගිරා සංදේශයේ ය. (.........)

13. රසභාව පිළිබඳ අදහස් දක් වූ පෙරදිග මතවාදීන් වන්නේ,

1. භරතමුණි, අභිනව ගුප්ත, උද්ගම ධනංජය 2. භරතමුණි, ඇරිස්ටෝටල්, අභිනව ගුප්ත
3. භරතමුණි, ප්ලේටෝ, නන්දිකේෂ්වර 4. භරතමුණි, උද්ගම ධනංජය, සොක්‍රටීස්
5. භරතමුණි, ප්ලේටෝ, සොක්‍රටීස් (.........)

- **අංක 14 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර පහත වගුව ආශ්‍රයෙන් තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | පොශ්වාන් | කුප්පායම් | ක්වංගෝයි | කිරීටම් |
| 2 | සලංගෙයි | කාසිමාලෙයි | දෝතිය | රිෂම්පුරිට් |
| 3 | කුණ්ඩලානි | මෝදිරිම් | කොක්කුම්බි | චූරා |
| 4 | ලෙහෙඟා | ගුංගුරු | කෝල්පුට්ටු | මුකුත්ති |

14. මණිපුරි නර්තන ශිල්පිනියකගේ රංග ආභරණ දෙකක් සඳහන් වන්නේ,

1. A තීරුවේ 2 පේලියේ සහ C තීරුවේ 2 පේළියේ ය.
2. A තීරුවේ 3 පේලියේ සහ C තීරුවේ 4 පේළියේ ය.
3. B තීරුවේ 2 පේලියේ සහ A තීරුවේ 4 පේළියේ ය.
4. C තීරුවේ 3 පේලියේ සහ D තීරුවේ 1 පේළියේ ය.
5. A තීරුවේ 3 පේලියේ සහ C තීරුවේ 3 පේළියේ ය. (.........)

15. කථකලි සහ කථක් සඳහා අඳිනු ලබන වස්ත්‍ර දෙකක් සඳහන් වන්නේ,

1. A තීරුවේ 1 පේලියේ සහ C තීරුවේ 2 පේළියේ ය.
2. B තීරුවේ 4 පේලියේ සහ D තීරුවේ 2 පේළියේ ය.
3. C තීරුවේ 1 පේලියේ සහ B තීරුවේ 3 පේළියේ ය.
4. B තීරුවේ 1 පේලියේ සහ A තීරුවේ 4 පේළියේ ය.
5. D තීරුවේ 3 පේලියේ සහ C තීරුවේ 2 පේළියේ ය. (.........)

16. භරත නාට්‍යයම් සඳහා යොදා ගනු ලබන්නේ,

1. හින්දුස්ථානී රාගධාරී සංගීතය සහ පුංග් බෙරයයි.
2. කර්ණාටක සංගීතය සහ මෘදංගයයි.
3. හින්දුස්ථානී සංගීතය සහ මෘදංගයයි.
4. කර්ණාටක සංගීතය සහ චෙණ්ඩාවයි.
5. කර්ණාටක සංගීතය සහ තබ්ලාවයි. (.........)

17. භරත සහ කථක් ඉගැන්වෙන ප්‍රධාන ආයතන දෙක වන්නේ,

1. අඩයාර්හි කලා ක්ෂේත්‍ර සහ ශාන්ති නිකේතනය
2. අඩයාර්හි කලා ක්ෂේත්‍ර සහ කේරළ කලා මණ්ඩලම්
3. අඩයාර්හි කලා ක්ෂේත්‍ර සහ විශ්වභාරතී විශ්වවිද්‍යාලය
4. කේරළ කලා මණ්ඩලම් සහ ලක්නව් භාත්ඛණ්ඩ
5. විශ්වභාරතී විශ්වවිද්‍යාලය සහ භාත්ඛණ්ඩ විශ්වවිද්‍යාලය (.........)

18. භාරතීය නර්තන සම්ප්‍රදායන්හි රඟ දක්වනු ලබන කථා වස්තූන් ඇතුළත් ග්‍රන්ථ කිහිපයකි.

1. මහාභාරතය, ගීත ගෝවින්දය, භගවත් ගීතාව
2. අභිනය දර්පණය, ගීත ගෝවින්දය, මහාභාරතය
3. සංගීත සම්භවය, රාමායනය, මහාභාරතය
4. භගවත් ගීතාව, සංගීත මකරන්දය, රාමායනය
5. ගීත ගෝවින්දය, නාට්‍ය ශාස්ත්‍රය, අභිනය දර්පණය (.........)

19. කථකලි නර්තනය බිහිවීමට පාදක වූ රාමනාට්ටම් සහ ක්‍රිෂ්ණාට්ටම් රචනා කළා යැයි සැලකෙන්නේ,

1. කාර්තික් තිරුනාල් මහරාජා සහ කොට්ටාරක්කාර රජු ය.
2. උන්නායි වරියර් සහ වල්ලතෝල් නාරායන මෙනන් ය.
3. කොට්ටාරක්කාර රජු හා කැලිකට්හි රාජා ජමෝරින් ය.
4. වල්ලතෝල් නාරායන මෙනන් හා රම්මුනි මෙනන් ය.
5. ක්‍රිෂ්ණ අය්යර් සහ කැලිකට්හි රාජා ජමෝරින් ය. (.........)

20. ආහාර්ය අභිනය යනු,

1. ශරීරයේ අංගයන්ගෙන් පරිබාහිරව කරන අදහස් ප්‍රකාශනයයි.
2. අංග, ප්‍රත්‍යාංග, උපාංගවලින් කරන අදහස් ප්‍රකාශනයයි.
3. මුහුණේ ඉරියව්වලින් කරන අදහස් ප්‍රකාශනයයි.
4. දෙබස් හා සංවාදවලින් කරන අදහස් ප්‍රකාශනයයි.
5. අංග චලනයන්ගෙන් කරන අදහස් ප්‍රකාශනයයි. (.........)

21. පහත සඳහන් රූපවලින් දක්වා ඇති භාවයන්ගෙන් ඉස්මතු වන රසයන් පිළිවෙළින්,



1. කරුණා, අද්භුත, වීර 2. රෞද්‍ර, වීර, ශෘංගාර 3. හාස්‍ය, කරුණා, භයානක
4. කරුණා, වීර, හාස්‍ය 5. භීබත්ස්‍ය, අද්භුත, ශාන්ත (.........)

22. සන්නි යකුන්ගේ දොළ තැබීම සහ පූජාකිරීම සඳහා සාදනු ලබන පිදේනි සැරසිල්ල හැඳින්වෙන්නේ,
1. දරහැව පිදේනිය 2. කපාල කුඩුව 3. උනනු පියන
4. කිරුළු තොප්පිය 5. සන්නි යකුන් වීදිය (.........)

23. රුසියානු බැලේ නාට්‍ය වර්ධනයට රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් රාජකීයයන් වන්නේ,
1. iv වන ලුවී රජ හා මහා පීටර් රජ
2. කැතරින් ඩී මෙලෙසි රැජින සහ ii වන හෙන්රි කුමරු
3. අලක්ෂේයි රජ සහ i වන එලිසබත් රැජින
4. මහා පීටර් රජ සහ ඇලෙක්ෂියස් රජ
5. මහා පීටර් සහ viii වැනි හෙන්රි රජ (.........)

24. ගබඩා කොල්ලය, රාමාමැරීම, කපුයක්කාරිය යන ශාන්තිකර්මවලට අයත් නාට්‍යමය පෙළපාලි අනුපිළිවෙළින් දක්වෙන්නේ,
1. කොහොඹාකංකාරිය, පහන් මඩුව, රටයකුම
2. රටයකුම, දෙවොල් මඩුව, සූනියම් ශාන්තිය
3. කොහොඹාකංකාරිය, ගම්මඩුව, රටයකුම
4. සන්නි යකුම, පහන් මඩුව, කොහොඹා කංකාරිය
5. කොහොඹා කංකාරිය, සන්නි යකුම, රටයකුම (.........)

25. කොහොඹාකංකාරියේ පුදලබන දෙවිවරු ලෙස සැලකෙන්නේ,
1. ඉරුගල් බණ්ඩාර, සමන් දෙවි, දෙවොල් දෙවි
2. ඉරුගල් බණ්ඩාර, වීරමුණ්ඩ දෙවි, කොහොඹා දෙවි
3. දෙවොල් දෙවි, පත්තිනි දේවිය, නාථ දෙවි
4. සතර දෙවි, වාහල දෙවි, බණ්ඩාර දෙවි
5. කොහොඹා දෙවි, වීරමුණ්ඩ දෙවි, දෙවොල් දෙවි (.........)

- **ප්‍රශ්න අංක 26 - 35 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. ''සිරිවස'' යනුවෙන් හඳුන්වනු ලබන්නේ, ආතත ගණයට අයත් වාද්‍ය භාණ්ඩයක් වන ........................................................ යි.

27. $^{\times}$ ධී නා $^{2}$ ධී ධී නා $^{0}$ තී නා $^{3}$ ධී ධී නා යන හින්දුස්ථානී තාලය දේශීය තාල පද්ධතියෙහි ............................................................... දෙතිතට සමානය.

28. සෞන්දර්ය අධ්‍යයන ආයතනය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය බවට පත් වූයේ .......................................................... වර්ෂයේ දී ය.

29. ගුරුහාමි, කාලි, සොත්තානා යන චරිත .......................................................... නාටකයට ඇතුළත් ය.

30. කාන්තාවන් සඳහා පහතරට රටයකුම ශාන්තිකර්මය පවත්වනු ලබන අතර ඒ අරමුණින් සබරගමුවේ .......................................................... ශාන්තිකර්මය පවත්වනු ලබයි.

31. මිනික්කු, පච්චා, කත්ති, තාඩි, කාරි යන අංග රචනා ක්‍රම භාවිතා වන්නේ, .......................................................... නර්තන සම්ප්‍රදායේ ය.

32. ගව, සිංහ, වලස් මෙම සත්ව චරිත .......................................................... නාටකයේ එන පූර්ව රංගනයන් ය.

33. ආවැන්දුම සහ යක්ඇනුම ............................................................... ශාන්තිකර්මයේ ඇතුළත් ශාස්ත්‍රීය නර්තන අංගයන් ය.

34. චිත්‍රසේනයන්ගේ නල දමයන්ති මුද්‍රා නාට්‍ය සඳහා පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේවයන් සමග ............................................................... ශූරීන් විසින් සංගීත නිර්මාණය කරන ලදි.

35. පහතරට නර්තන සම්ප්‍රදාය හා දෙවුන්දර .................................... දේවාල පෙරහැර බැඳී පවතී.

- **36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර තිත් ඉර මත ලියන්න.**

36. ලෝක නර්තන දිනය කවදාද? එදින නම් කරන ලද්දේ කුමන නර්තන ශිල්පියාගේ උපන් දිනය මුල් කොට ගෙනද?

    1. දිනය - ....................................................... 2. ශිල්පියා - ..........................................................

37. පහත සඳහන් නර්තන අංග අයත් වන්නේ කුමන නර්තන සම්ප්‍රදායන් වලටද?

    1. මුල් මාත්‍රය - 1. ..........................................................................................
    2. ශුද්ධ මාත්‍රය - 2. ..........................................................................................

38. පහත සඳහන් ශිල්පීන් ප්‍රවීනත්වයක් දරන්නේ කුමන නර්තන සම්ප්‍රදායටද?

1. රුක්මනී දේවි අරුණ්ඩේල් - 1. ..........................................................................................

2. බින්ද්‍රාධින් මහාරාජ් - 2. ..........................................................................................

39. ''රෝයල් ඇකඩමි ඕ ලා ඩාන්ස්'' ප්‍රථම බැලේ නර්තන පාසල ආරම්භ කරන ලද රට සහ එහි නිර්මාතෘ කව්රුන්ද?

1. රට - 1. ..........................................................................................

2. නිර්මාතෘ - 2. ..........................................................................................

- **40 සිට 42 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර රූපසටහන් ආශ්‍රයෙන් තිත් ඉර මත ලියන්න.**



1 2 3 4

40. අංක 02 රූපයේ දැක්වෙන නළඟන රුව කුමන යුගයට අයත් කවර ස්ථානයක දක්නට ලැබෙන්නක්ද?

1. යුගය - 1. ..........................................................................................

2. ස්ථානය - 2. ..........................................................................................

41. අංක 01 රූපයෙන් දැක්වෙන කෝළමේ චරිත දෙක කුමක්ද?

1. චරිතය - ............................................ 2. චරිතය - ..........................................

42. අංක 03 සහ 04 රූපයෙන් දැක්වෙන නර්තනයන්ට සමාන සිංහල නර්තන අංග දෙක නම් කරන්න.

1. 03 රූපය - ..........................................................................................

2. 04 රූපය - ..........................................................................................

43. උදය ශංකර් විසින් නිෂ්පාදිත ප්‍රකට නෘත්‍ය නාටක දෙක නම් කරන්න.

1. ..........................................................................................

2. - ..........................................................................................

44. ''හංසවිල'' බැලේ නාට්‍ය නිෂ්පාදනට මුල් වූ රුසියානු සමාගම සහ එහි සංගීතඥයා නම් කරන්න.

1. රුසියානු සමාගම - ..........................................................................................

2. සංගීතඥයා - ..........................................................................................

45. පහතරට නර්තන සම්ප්‍රදායේ දක්නට ලැබෙන ප්‍රධාන ශෛලීන් දෙක නම් කරන්න.

1. ...........................................................................................

2. ...........................................................................................

46. රංග භූමිය කමත සහ තානායම්පල ලෙස ගෙන රඟ දක්වනු ලබන නාටක දෙක කුමක්ද?

1. කමත - .....................................  2. තානායම්පල - .....................................

47. අවකාශයේ දී සඳහන් වන දිශා හා තල සංඛ්‍යාත්මකව දක්වන්න.

1. දිශා - ...........................................  2. තල - ...........................................

48. 'ශීත වර්ණ' සහ 'උෂ්ණ වර්ණ' ආලෝක වර්ණයේ දී හඳුන්වනු ලබන්නේ කෙසේද?

1. ශීත වර්ණ - 1. ...........................................................................................

2. උෂ්ණ වර්ණ - 2. ...........................................................................................

49. 'පරවිය' සහ 'සත්පත්තිනි' කලාකෘතීන් නිර්මාණය කරනු ලැබූ ප්‍රවීන නර්තන ශිල්පීන් සඳහන් කරන්න.

1. පරවිය - ...........................................................................................

2. සත්පත්තිනි - ...........................................................................................

50. 'යස රුවට කොරල හැඩි තලගොයා ......' මින් මතුවන භාවය සහ රසය සඳහන් කරන්න.

1. භාවය - ...........................................................................................

2. රසය - ...........................................................................................